# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1203/9 - 2001 සැප්තැම්බර් 24 වැනි සඳුදා - 2001.09.24

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡේදය – සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී - බී. 21/78.

#### 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත

1995 අංක 1 දරන පනතින් අවසන්වරට සංශෝධිත, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු 140 වන වගන්තිය යටතේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ලේකම්,
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2001 සැප්තැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මේ නියමාවලිය 2001 අංක 3 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ විට ක්‍රියාත්මක විය යුතු ය.

2. අංක 1155/20 හා 2000 ඔක්තෝබර් මස 27 වන දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ 2000 අංක 4 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන (සංශෝධන) නියමාවලියෙන් අවසන් වරට සංශෝධිත අංක 83/7 හා 1980 අප්‍රේල් මස 10 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ 1980 අංක 1 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි 13 වන ඡේදයේ (ඩ) අනුඡේදයට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන (ණ) අනුඡේදය ඇතුළත් කිරීමෙන් :–

"(ණ) කාම ව්‍යාධි වේදය".

(2) එහි 14 වන ඡේදයෙහි–

(i) ඒ ඡේදයේ (2) (ඇ) (iii) අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :–

" (iii) සායනික නියෝප්ලාස්මවේදය සහ කාම ව්‍යාධිවේදය යන විශේෂඥ ක්ෂේත්‍රය වෙනුවෙන්, ඒ ඡේදය 2(ඇ) (1) අනුඡේදයේ සඳහන් අභ්‍යාස මධ්‍යස්ථානවලින් නියෝජිතයන් නවදෙනෙක් ; ඔවුන් අතරින් යටත් පිරිසෙයින් තිදෙනකු –

(අ) මහරගම පිළිකා ආයතනය සහ

(ඇ) මධ්‍යම එස්. ටී. ඩී. සායනය

යන ප්‍රධාන අභ්‍යාස මධ්‍යස්ථානවලින් විය යුතුය.".